# මාසික
# විවරණිකාව

2011 ජනවාරි



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

61 වැනි වෙළුම 1 වැනි කලාපය

**2011 ජනවාරි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.**

# පටුන

පිටුව


| | | | |
|---|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් ජනවාරි 2011 | ........... | .......... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2011 ජනවාරි | ........... | .......... | 06 |
| 1. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය - 2011 ජනවාරි | ........... | .......... | 06 |
| 2. ශ්‍රී ලංකාවේ ප්‍රථම සහල් පිටි ඇඹරුම් කර්මාන්තශාලාව විවෘත කිරීම | ........... | .......... | 07 |
| 3. 2010 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය | ........... | ........... | 07 |
| 4. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) | ........... | ........... | 10 |

## 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2011 ජනවාරි

### රාජ්‍ය මූල්‍ය අංශය

- මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ රජයේ අමාත්‍යාංශවලට සෘජුවම ලැබෙන විදේශ ණය හෝ පරිත්‍යාග මත ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්වලට ආනයනය කරන භාණ්ඩ, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයුර්වේද නිෂ්පාදන සඳහා අවශ්‍යවන ආනයනික අමුද්‍රව්‍ය සහ එම නිෂ්පාදන ඇසිරීමට භාවිතා කරන ඇසුරුම් ද්‍රව්‍ය (විලේපන සැකසීම් හැර) ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- සං.වි. සංකේත 2713.20 සහ සං.වි. ශීර්ෂ 27.14 යටතේ ආනයන කරන ලද බිටුමන් අඩංගු සංයෝග සහ සං.වි. සංකේත 8701.10.10, 8701.10.90, 8701.90.10 සහ 8701.90.20 යටතේ ආනයනය කරන ලද ට්‍රැක්ටර් වර්ග ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- සම් කර්මාන්තය හෝ පාවහන් කර්මාන්තය සඳහා භාවිතා වන ඇතැම් ආනයනික යන්ත්‍ර සහ උපකරණ, අධි තාක්ෂණික වෛද්‍ය, විද්‍යාගාර සහ අධ්‍යාපනික උපකරණ, කුලී රථ මීටර, කෘෂිකාර්මික යන්ත්‍ර හා කොටස්, විද්‍යුත් උපකරණ, විලාසිතා ආභරණ නිෂ්පාදන සඳහා භාවිතා කරන භාණ්ඩ, ගුවන් යානා ආකෘති හා කොටස් සහ සන්නිවේදනය සඳහා භාවිතා වන අධි තාක්ෂණික උපකරණ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- පෙට්‍රල් ආනයනය සඳහා ලබාදුන් තීරු බදු අත්හැරීම ලීටරයකට රුපියල් 20 සිට ලීටරයකට රුපියල් 30 දක්වා වැඩිකරන ලද අතර, බලපවත්නා තීරු බදු අනුපාතිකය ලීටරයකට රුපියල් 5 කි.

- කිරි පිටි ආනයනය සඳහා සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලද අතර, මෙතැන් සිට වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද පමණක් බලපැවැත්වේ.

- සියයට 20 ක් ලෙස පැවති එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 12 දක්වා අඩු කරන ලදී. එබැවින්, ශුන්‍ය අනුපාතය (Zero rate) අදාල වන භාණ්ඩ හැර අනෙකුත් සියළු දෑ සඳහා අදාළ එකතු කළ අගය මත බදු අනුපාතය, සියයට 12 ක් වේ.

- සියයට 3 ක්ව පැවති ජාතිය ගොඩනැගීමේ බදු අනුපාතය සියයට 2 දක්වා අඩු කරන ලදී.

- ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.

- විදුලි සංදේශ සේවා සඳහා පැවති සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, එකතු කළ අගය මත බද්ද වෙනුවට සියයට 20 ක විදුලි සංදේශ බද්දක් හඳුන්වා දෙන ලදී.

- විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් සඳහා වාර්ෂික දළ පිරිවැටුම මත සියයට 2 ක සෙස් බද්දක් හඳුන්වා දෙන ලදී.

- පළාත් සභා මගින් එකතු කරන ලද පිරිවැටුම් බද්ද ඉවත් කරන ලදී.

- කොටස් ගනුදෙනු බද්ද සියයට 0.2 සිට සියයට 0.3 දක්වා වැඩි කරන ලදී.

- සැර මත්පැන් (මෝල්ට් මත්පැන් හැර සියළුම මත්පැන්) සඳහා වූ නිෂ්පාදන බද්ද සම්මත සැර මත්පැන් ලීටරයකට රුපියල් 50 කින් වැඩි කරන ලදී.

- සෑම රජයේ සේවකයෙකුටම ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 5 ක විශේෂ දීමනාවක් ලබා දෙන ලදී.

- රජයේ සේවයේ සිටින මාණ්ඩලික නොවන ශ්‍රේණිය සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 5,850 දක්වා රුපියල් 600 කින් වැඩි කරන ලදී.

- විශ්‍රාමිකයන් සඳහා වන මාසික වියදම් දීමනාව මසකට රුපියල් 2,675 දක්වා රුපියල් 300 කින් වැඩි කරන ලදී.

- විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවන "අධ්‍යන දීමනාව", අධිකරණ සේවා කොමිසම යටතේ සිටින අධිකරණ සාමාජිකයන්ට ගෙවන "පෞද්ගලික දීමනාව", වෛද්‍යවරුන් සඳහා "ඇමතු විට පැමිණීම්" දීමනාව සියයට 25 කින් වැඩි කරන ලදී.

### ඉන්දියානු අපනයන - ආනයන බැංකුවෙන් ලද ණය

ඕමන්තේ සිට පලාලි දක්වාද, මඩු දේවස්ථානයේ සිට තලෙයිමන්නාරම දක්වා ද, මැදවච්චියේ සිට මඩු දේවස්ථානය දක්වා ද වූ දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 නොවැම්බර් 26 වැනිදින ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු අපනයන-ආනයන බැංකුව අතර එ.ජ.ඩොලර් මිලියන 416.39 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 46.34 ක) ණය මුදල සඳහා වූ ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වසර 1 ක් සඳහා වූ ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය මත සියයට 0.5 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ද, පළමු මුදාහැරීම සිදු කරන දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු වන ණය මුදල මත සියයට 0.5 ක එක් වරක් පමණක් ගෙවිය යුතු කළමනාකරණ ගෙවීමක්ද, ණය මුදලින් ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක්ද අදාල වේ. අවුරුදු 5 ක සහන කාලයකට යටත්ව අවුරුදු 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයෙන් ලද ප්‍රදාන

උතුරු පළාතේ පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 ජනවාරි මස 31 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය අතර එ.ජ.ඩොලර් මිලියන 2.73 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 303.49 ක) ප්‍රදානයක් සඳහා වූ ගිවිසුමකට අත්සන් තබන ලදී.

## 2 වන කොටස

# පුවත්පත් නිවේදන

## 2011 ජනවාරි

### 1. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය - 2011 ජනවාරි

*කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පදනම් වර්ෂ =2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මත පදනම් වූ උද්ධමනය 2010 දෙසැම්බර් මාසයේ දී සියයට 6.9 ක් විය. 2010 වසරේදී වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 5.9 ක් විය. මේ අනුව, කාලගුණික සාධක සහ සැපයුමට ඇතිවන බාධාවන් හේතුවෙන් කලින් කල ඇතැම් ආහාර අයිතමවල මිල ගණන් ඉහළ ගියද, උද්ධමනය දිගින් දිගටම මැදි තනි අගයක (Mid single digit levels) අඛණ්ඩව පැවතුණි. කෙසේ වෙතත් මෙම මිල ගණන් ඉහළයාම, දේශීය උද්ධමනය මත තාවකාලික බලපෑමක් පමණක් ඇතිකරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් දෙවැනි වටයේ දී ඇතිවන බලපෑම් තුළින් ආර්ථිකය තුළ සැලකිය යුතු ඉල්ලුම් පීඩන ඇති බවක් වර්තමාන මුදල් අංශයේ වර්ධනයන් තුළින් නොපෙන්වයි. ශ්‍රී ලංකා රුපියලේ අගය දිගින් දිගටම ස්ථායීව පැවතීම හේතුවෙන් ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළයාම සමනය වී ඇති අතර, රජය විසින් ගත් ක්‍රියාමාර්ග, විශේෂයෙන්ම, ආනයනික භාණ්ඩවලට අදාළ තීරු බදු අඩු කිරීම, මිල පීඩනයන් තවදුරටත් අඩු කිරීමට උපකාරී විය.*

ඉදිරි කාලය තුළදී, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදිතය, වගාකරනු ලබන ඉඩම් ප්‍රමාණය වැඩිවීමත් සමඟ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව, යටිතල පහසුකම් වර්ධනය කිරීමත්, සමගම ආර්ථිකයේ බොහෝ අංශවල ධාරිතා උපයෝජනය වැඩිවීම, ඵලදායීතාව ඉහළ යාම සහ යෙදවූ ප්‍රාග්ධනයේ කාර්යක්ෂමතාව වර්ධනය වීම දේශීය ආර්ථිකයේ මිල පීඩනයන් අඩු කිරීමට උපයෝගී වනු ඇත.

2010 නොවැම්බර් මාසය වන විට වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙනු ලැබූ ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 23 ක් වූ අතර, 2009 නොවැම්බර් මාසයේ දී සියයට 6 ක පමණ සෘණ වර්ධනයක් පැවතීමෙන් ඇති වූ පදනම් බලපෑම මෙයට තරමක් දුරට හේතු විය. මෙම කාලය තුළ 2010 වසරේ පුළුල් මුදල් සැපයුමෙහි සාමාන්‍ය වර්ධනය සියයට 15 ක් වූ අතර, එය 2010 වසර සඳහා වන මුදල් වැඩසටහනෙහි දක්වා ඇති ඉලක්කය තුළ පැවතුණි.

රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්ට අදාළ දත්ත අනුව 2010 වර්ෂයේදී අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8 ක් වූ ඉලක්කගත මට්ටම තුළ මනාව පවතිනු ඇත. මේ අතර, රාජ්‍ය අයවැය හිඟය 2011 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.8 ක මට්ටමේ පවත්වා ගැනීමට රජය කැපවී ඇති අතර, වත්මන් දර්ශක අනුව මෙම ඉලක්කය සපුරාගැනීමට හැකි බව පෙනී යයි.

ඉදිරි කාලපරිච්ඡේදය තුළ අනිසි උද්ධමන පීඩනයන් ඇති නොකර, රටෙහි වර්ධනයට දැඩි ලෙස උපකාරී වෙමින්, නව වර්ධිත අංශ ඇතුළත්ව ආර්ථිකයෙහි සියලු අංශයන්හි නව සහ පුළුල් ආයෝජනයන් සිදුකිරීමට අවශ්‍ය අවකාශය ඉහත සඳහන් කළ සාර්ව ආර්ථික වාතාවරණය තුළින් සලසනු ඇත. ඒ අනුව, ඉදිරි වසර කිහිපය තුළදී ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි පෞද්ගලික අංශයෙහි දායකත්වය සැලකිය යුතු මට්ටමක අඛණ්ඩව පවත්වාගෙන යාම ඉතා වැදගත් වනු ඇත. ඒ අනුව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි ප්‍රමාණවත් ලිහිල් කිරීමක් යෝග්‍ය සහ කාලීන වන අතර, මෙවැනි ප්‍රතිපත්ති ස්ථාවරයක්, ආර්ථිකය තුළ උද්ධමන පීඩනයන් වැඩි නොකර, ඉදිරි කාලපරිච්ඡේදය තුළදී පොලී ගණනය කිරීමේදී අඩු අවදානම් පරිසරය පිළිඹිබු කරමින්, වෙළෙඳපොළ පොලී අනුපාතිකයන් තවදුරටත් පහත යාමට දායක වනු ඇත.

ඉහතදී සාකච්ඡා කළ මූලික සාධක සියල්ල සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2011 ජනවාරි මස 10 වන දින පැවැති රැස්වීමේ දී 2011 ජනවාරි 11 සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය පදනම් අංක 25 කින් සහ ප්‍රති විකුණුම් අනුපාතිකය පදනම් අංක 50 කින් අඩුකර පිළිවෙලින් සියයට 7.00 ක් සහ සියයට 8.50 ක් ලෙස පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2011 පෙබරවාරි 08 වන දින නිකුත් කිරීමට නියමිතය.

## 2. ශ්‍රී ලංකාවේ ප්‍රථම සහල් පිටි ඇඹරුම් කර්මාන්තශාලාව විවෘත කිරීම

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය "විස්කම්" ණය යෝජනා ක්‍රමය යටතේ නවීන ඇඹරුම් තාක්ෂණය සහිත ශ්‍රී ලංකාවේ ප්‍රථම සහල් පිටි කර්මාන්තශාලාව ආරම්භ කිරීමට අවශ්‍ය ණය පහසුකම් ලබා දෙන ලදී.*

එකතු කළ වටිනාකමක් සහිත කෘෂි නිෂ්පාදන නිපදවීමට අතිරික්ත සහල් නිෂ්පාදනය යොදා ගැනීමේ අරමුණ සහිතව ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සහ රාජ්‍ය බැංකු දෙකක සහයෝගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව දිවයින තුළ සහල් පදනම් කරගත් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ නිරතව සිටී.

උතුරු සහ නැගෙනහිර පළාත්වල වී වගා බිම් සම්පූර්ණයෙන්ම වගා කිරීමත් සමඟ රටේ වී නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වර්ධනය වෙතැයි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු කරයි. එබැවින්, වෙළෙඳපොළ ස්ථායිතාවය පවත්වා ගැනීම සඳහා සහ ප්‍රාදේශීය ගොවීන්ට ලාභදායී මිලක් ලබාදීම සඳහා අතිරික්ත වී නිෂ්පාදනය සහල් පදනම් කරගත් වෙනත් එකතු කළ වටිනාකමෙන් යුතු නිෂ්පාදනයක් බවට පරිවර්තනය කළ යුතුව ඇත. තිරිඟු පිටිවලින් කෙරෙන නිෂ්පාදනවලට වඩා සහල් පිටිවලින් කෙරෙන නිෂ්පාදන සෞඛ්‍යයට හිතකර බවට පිළිගැනීමක් පවතින නිසා සහල් පිටි කර්මාන්තශාලා ඇති කිරීම මගින් දිවයිනට වාසි රැසක් අත්වනු ඇත.

තවද, රසකැවිලි සහ පාන් ඇතුළු බේකරි නිෂ්පාදන සඳහා යෝග්‍යවන මයික්‍රෝන 120 ට වඩා අඩු අංශු සහිත පිටි නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති නවීන ඇඹරුම් තාක්ෂණය උපයෝගී කරගන්නා කර්මාන්තශාලා දෙකක් ආරම්භ කිරීම සඳහා මහ බැංකුවේ "විස්කම්" ණය යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය බැංකු දෙකක් මගින් ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ලබා දී ඇත.

කර්මාන්තකරුවන් දක්වන ආකාරයට, මයික්‍රෝන ප්‍රමාණයේ පිටි අංශු ඉතාමත් කුඩා බැවින්, ඒවා යොදාගෙන සහල් පිටි උපරිම වශයෙන් 80% ක් සහ තිරිඟු පිටි 20% ක් මිශ්‍ර කිරීමෙන් පාන් නිෂ්පාදනය කිරීමට බේකරිකරුවන්ට හැකියාව ලැබේ.

2011 ජනවාරි මස 20 වන දින වේයන්ගොඩදී පැවැත්වෙන විවෘත කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සහභාගි වීමට නියමිතය.

ප්‍රථම සහල් පිටි කර්මාන්තශාලාව සිය කටයුතු එය පිහිටි වේයන්ගොඩදී ආරම්භ කර ඇති අතර, එහි සමාරම්භක උත්සවය පහත පරිදි පැවැත්වීමට කටයුතු යෙදී ඇත.

දිනය : 20/01/2011
වේලාව : පෙ.ව. 10.00
ස්ථානය : බණ්ඩාර ඉන්ඩස්ට්‍රියල් සර්විසස් (පුද්) සමාගම
අංකඃ 04, ආහාර දෙපාර්තමේන්තු ගබඩා සංකීර්ණය,
වේයන්ගොඩ.


ශ්‍රී ලංකා මහ බැංකුවේ "විස්කම්" ණය යෝජනා ක්‍රමය යටතේ සම්පාදනය කෙරෙන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් මගින් ලංකා බැංකුව විසින් මෙම ව්‍යාපෘතියට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දී ඇත. එවැනි කර්මාන්තශාලා 25 ක් දිවයිනේ සෙසු ප්‍රදේශවලද ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව බලාපොරොත්තු වෙයි. වේයන්ගොඩ, බණ්ඩාර ඉන්ඩස්ට්‍රියල් සර්විසස් (පුද්.) සමාගම විසින් මෙම නිෂ්පාදනය "Healthy Fla" ලෙස නම්කර ඇත.

## 3. 2010 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය

*2010 නොවැම්බර් මාසයේදී අපනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේදී එ.ජ.ඩොලර් මිලියන 834 දක්වා සියයට 36.0 කින් සැලකිය යුතු අයුරින් වර්ධනය විය. මෙය 2004 ඔක්තෝබර් මාසයේ සිට මේ දක්වා පැවැති වැඩිම මාසික වර්ධනය වන අතර බෝට්ටු, බයිසිකල්, විද්‍යුත් උපකරණ, රබර් නිෂ්පාදිත, ඛනිජ තෙල් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ ආදී සාපේක්ෂ වශයෙන් නව අපනයන කාණ්ඩයන් කිහිපයක සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹු කරයි.*


මෑත කාලයේදී පැවැති ඉහළතම සමුච්චිත වර්ධන අනුපාතිකය පිළිබිඹු කරමින්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේදී 2010 පළමු මාස එකොළහ තුළ සමුච්චිත අපනයන ආදායම එ. ජ. ඩොලර් මිලියන 7,339 දක්වා සියයට 15.4 කින් වර්ධනය විය. 2010 නොවැම්බර් මාසයේදී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,113 දක්වා සියයට 19.1 කින් වර්ධනය වූ අතර, අන්තර් භාණ්ඩ ආනයන ඉහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳා බැලීමේදී 2010 වසරේ පළමු මාස එකොළහ තුළ සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 12,083 දක්වා සියයට 32.6 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී එ.ජ.ඩොලර් 2,753 ක්ව පැවැති වෙළෙඳ හිඟය මෙම කාලපරිච්ඡේදය තුළදී එ.ජ.ඩොලර් මිලියන 4,744 දක්වා පුළුල් විය. අපනයන ආදායමේ වර්ධනයට විශාලතම දායකත්වය කාර්මික අපනයන මගින් ද, අනතුරුව කෘෂිකාර්මික අපනයන මගින් ද ලැබුණි. කාර්මික අපනයන මුළු අපනයනයන්ගෙන් සියයට 76 කට දායකත්වය ලබා දුන් අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඇඟළුම් වෙළෙඳපොළවල් වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත ඇඟළුම් අපනයනයන්ගෙන් 2010

නොවැම්බර් මාසයේදී ලද ආදායම පිළිවෙලින් සියයට 39.2 කින් සහ සියයට 28.7 කින් වර්ධනය විය. 2010 නොවැම්බර් මාසයේදී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 67 දක්වා සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. මේ සඳහා නැව්, බෝට්ටු සහ බයිසිකල් වැනි ප්‍රවාහන උපකරණ සහ පරිණාමක, ස්ථාවර පරිවර්ථක, ප්‍රේරක, පරිපථ සහ පරිවරණීය රැහැන් ආදී විද්‍යුත් උපකරණ ආදිය ඇතුළත් වෙයි. රබර් නිෂ්පාදිත, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ආහාර, පාන හා දුම්කොළ යන අංශයන් ද 2010 නොවැම්බර් මාසයේ කාර්මික අපනයන




ආදායමේ වර්ධනයට දායකත්වය ලබා දී ඇත. මුළු අපනයන ආදායමෙන් සියයට 22.9 කට දායකත්වය ලබාදෙන කෘෂිකාර්මික අපනයන ආදායම, සියළුම කෘෂිකාර්මික අපනයන උප කාණ්ඩයන්හි අපනයන පරිමාවේ සහ මිලෙහි වර්ධනයන් පිළිබිඹු කරමින් වර්ධනය විය. 2010 නොවැම්බර් මාසයේදී, තේ සහ රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල පිළිවෙලින් එ.ජ.ඩොලර් 4.55 ක් සහ එ.ජ.ඩොලර් 4.14 ක් ලෙස ඉහළ මට්ටමක පැවතිණි.

ප්‍රධාන වශයෙන්ම ඛනිජ තෙල් ඇතුළු අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ යාම ආනයන වියදම වර්ධනය වීමට හේතු විය. 2009 නොවැම්බර් මාසයේදී එ.ජ.ඩොලර් 79.18 ක්ව පැවති බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2010 නොවැම්බර් මාසයේදී එ.ජ.ඩොලර් 84.85 ක් දක්වා සියයට 7.2 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2010 නොවැම්බර් මාසයේදී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සැලකිය යුතු ලෙස ඉහළයාම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ මෝටර් රථ ආනයනයයි. කෙසේ වුවත් ප්‍රධාන වශයෙන් සහල්, සීනි සහ තිරිඟු පිටි ආනයන වියදම අඩුවීම හේතුවෙන් ආහාර ආනයන වියදම පහත වැටුණු අතර, ගෝලීය සැපයුම් අවහිරතාවයන් නිසා ජාත්‍යන්තර මිල ගණන් ඉහළ යාමෙන් 2010 නොවැම්බර් මාසයයේදී කිරි නිෂ්පාදිත ආනයන වියදම සියයට 48.8 කින් වර්ධනය විය. 2010 නොවැම්බර් මාසයේදී ප්‍රවාහන භාණ්ඩ හැර අනෙකුත් සියළු ආයෝජන




උප කාණ්ඩයන්ගේ ආනයනයන් වර්ධනය විය. 2010 වසරේ පළමු මාස එකොළහ තුළදී ලැබුනු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවැති අගය ඉක්මවා යමින් එ.ජ.ඩොලර් මිලියන 3,761.9 දක්වා (වාණිජ බැංකුවල සංශෝධන ගැලපීමෙන් පසු) සියයට 23.9 කින් වර්ධනය විය. 2010 දෙසැම්බර් මස අවසන් වන විට ආසියානු නිෂ්කාශන සංගමයේ !ක්ෂ° ලැබීම් රහිත දළ නිල සංචිත ප්‍රමාණය තවදුරටත් එ.ජ.ඩොලර් බිලියන 6.6 ක් ලෙස ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පැවතුණි. පසුගිය මාස 12 තුළ පැවති සාමාන්‍ය මාසික ආනයන වියදම වන එ.ජ.ඩොලර් මිලියන 1,108 ට අනුව බලන විට, ආසියානු නිෂ්කාශන ලැබීම් රහිත දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 6.0 කට සමාන වේ.

මෙම කාලපරිච්ඡේදය තුළ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

**විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරීත්වය - 2010 නොවැම්බර් සහ 2010 ජනවාරි - නොවැම්බර්**

| කාණ්ඩය | 2009 නොවැ. එ.ජ.ඩො. මිලියන | 2010 නොවැ. එ.ජ.ඩො. මිලියන | නොවැ. වර්ධනය % | 2009 ජනː සිට නොවැ. එ.ජ.ඩො. මිලියන | 2010 ජනː සිට නොවැ. එ.ජ.ඩො. මිලියන | ජනː සිට නොවැ. වර්ධනය % |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **613.0** | **833.6** | **36.0** | **6,361.1** | **7,339.1** | **15.4** |
| කෘෂිකාර්මික | 155.8 | 191.1 | 22.7 | 1,521.0 | 1,850.5 | 21.7 |
| මෙයින්: තේ | 105.0 | 120.2 | 14.5 | 1,068.4 | 1,246.5 | 16.7 |
| කාර්මික | 450.0 | 633.6 | 40.8 | 4,757.3 | 5,403.2 | 13.6 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 263.9 | 355.0 | 34.5 | 2,930.7 | 3,038.4 | 3.7 |
| ඛනිජ ද්‍රව්‍ය | 7.3 | 8.9 | 23.2 | 82.8 | 85.2 | 2.9 |
| **ආනයන** | **934.7** | **1,113.0** | **19.1** | **9,114.3** | **12,083.0** | **32.6** |
| පාරිභෝගික භාණ්ඩ | 180.6 | 236.9 | 31.1 | 1,771.0 | 2,571.6 | 45.2 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 115.6 | 110.4 | -4.6 | 1,115.8 | 1,482.0 | 32.8 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 65.0 | 126.5 | 94.6 | 655.2 | 1,089.6 | 66.3 |
| අන්තර් භාණ්ඩ | 498.7 | 606.6 | 21.6 | 5,011.3 | 6,696.3 | 33.6 |
| මෙයින්: ඛනිජ තෙල් | 150.0 | 215.5 | 43.6 | 1,847.9 | 2,694.9 | 45.8 |
| රෙදිපිළි හා ඇඟළුම් | 139.3 | 160.2 | 15.0 | 1,308.6 | 1,536.4 | 17.4 |
| ආයෝජන භාණ්ඩ | 248.4 | 264.9 | 6.6 | 2,226.8 | 2,645.9 | 18.8 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 87.2 | 123.2 | 41.3 | 910.4 | 1,062.3 | 16.7 |
| ප්‍රවාහන උපකරණ | 79.2 | 47.5 | -40.0 | 402.1 | 571.4 | 42.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 57.8 | 67.1 | 16.0 | 653.9 | 736.0 | 12.5 |
| **වෙළෙඳ ශේෂය** | **-321.7** | **-279.4** | **-13.2** | **-2,753.1** | **-4,743.9** | **72.3** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **261.6** | **381.5** | **45.8** | **3,035.4** | **3,761.9** | **23.9** |

මූලයන් :- ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

**4. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)**

**2009, 2010 සහ 2011**

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2009 | 2010 | 2011 | 2009 | 2010 | 2011 | 2009 | 2010 | 2011 |
| ජනවාරි | 203.1 | 216.4 | 231.2 | -0.3 | 1.4 | 1.3 | 10.7 | 6.5 | 6.8 | 21.6 | 3.1 | 6.0 |
| පෙබරවාරි | 202.9 | 216.9 | | -0.1 | 0.2 | | 7.6 | 6.9 | | 20.3 | 3.1 | |
| මාර්තු | 202.0 | 214.8 | | -0.4 | -1.0 | | 5.3 | 6.3 | | 18.6 | 3.2 | |
| අප්‍රේල් | 201.0 | 212.6 | | -0.5 | -1.0 | | 2.9 | 5.8 | | 16.7 | 3.4 | |
| මැයි | 205.1 | 215.9 | | 2.0 | 1.6 | | 3.3 | 5.3 | | 14.7 | 3.6 | |
| ජුනි | 207.8 | 217.7 | | 1.3 | 0.8 | | 0.9 | 4.8 | | 12.5 | 3.9 | |
| ජූලි | 208.7 | 217.6 | | 0.4 | 0.0 | | 1.1 | 4.3 | | 10.4 | 4.2 | |
| අගෝස්තු | 208.1 | 218.6 | | -0.3 | 0.5 | | 0.9 | 5.0 | | 8.5 | 4.6 | |
| සැප්තැම්බර් | 208.6 | 220.7 | | 0.2 | 1.0 | | 0.7 | 5.8 | | 6.6 | 23.2 | |
| ඔක්තෝබර් | 209.4 | 223.3 | | 0.4 | 1.2 | | 1.4 | 6.6 | | 5.2 | 23.4 | |
| නොවැම්බර් | 211.0 | 225.8 | | 0.8 | 1.1 | | 2.8 | 7.0 | | 4.1 | 23.0 | |
| දෙසැම්බර් | 213.5 | 228.3 | | 1.2 | 1.1 | | 4.8 | 6.9 | | 3.4 | 5.9 | |

**මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**